# පුරප්පාඩු

## රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව (SPMC)

### ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යාංශය

පහත සඳහන් පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් කාර්යශූර ස්වයං උද්යෝගී, වෘත්තිය ඉහළ අභිලාෂයන් කෙරෙහි නැඹුරු කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කළහැකි අයදුම්කරුවන් රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව සමග එක්වීම අපේක්ෂා කරමු.

**සෑම අයදුම්කරුවෙකුම**

(i) ශ්‍රී ලාංකිය පුරවැසියෙකු විය යුතුය

(ii) තනතුරට පැවරෙන රාජකාරී මැනවින් ඉටුකිරීම සඳහා සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක හා පළාතක සේවය කිරීම සඳහා කායික හා මානසික යෝග්‍යතාවයෙන් හා නිරෝගිතාවයෙන් යුක්ත විය යුතුය.

(iii) මනා චරිතයකින් යුක්ත අයකු විය යුතුය.

**(I) නිෂ්පාදන කළමනාකරු තනතුර (MM 1-1 - ශ්‍රේණිය II)**

**සුදුසුකම් : බාහිර අපේක්ෂකයින්**

(අ) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් ස්වභාවික විද්‍යා, ඖෂධවේදය හෝ ඉංජිනේරු යන විෂය ධාරාවකින් ලබාගත් ප්‍රථම උපාධියක් **හෝ**

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් / ආයතනයකින් ලබාගත් වෙනත් සමාන අන්දමේ ප්‍රථම උපාධියක්. **සහ**

(ආ) පරිගණක සාක්ෂරතාව (Literacy) **සහ**

(ඇ) ඖෂධ නිෂ්පාදන ක්ෂේත්‍රයට අදාළව සුදුසුකම් ලැබීමෙන් පසුව අවම වශයෙන් වසර පහක (05) ක පළපුරුද්ද.

**සුදුසුකම් : අභ්‍යන්තර අපේක්ෂකයින්**

1. බාහිර අපේක්ෂකයින් හට අදාළ වන හා අවශ්‍ය වන සුදුසුකම් ලබාතිබීම. **හෝ**
2. තනතුරට අදාළ වන විෂය ක්ෂේත්‍රයක කණිෂ්ඨ කළමනාකරු වර්ගීකරණයේ (JM1-1) තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :** MM 1-1-2016 - රු. 53,175/=10X1,375/= 15X1,910/= - 95,575/= මෙයට අතිරේකව (ඉහත සඳහන් වැටුපට අමතරව) රජය විසින් අනුමත කර ඇති දීමනාද ගෙවනු ලැබේ.

**වයස :** වයස, අවුරුදු 22 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට බලනොපානු ඇත.

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :** ලිඛිත තරගකාරී විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**නිෂ්පාදන කළමනාකරු තනතුර සඳහා වන ආන්තික ප්‍රතිලාභ :**

- පැමිණීම සහ කාර්ය සාධනය සඳහා දිරි දීමනා.
- උපයෝගී කර නොගත් වාර්ෂික හා අසනීප නිවාඩු සඳහා, මුදල් ගෙවීම.
- වෛද්‍ය රක්ෂණ යෝජනාක්‍රමය සහ වෛද්‍ය විය පැහැදම් සඳහා වැය වූ මුදල්, ප්‍රතිපූරණය කිරීම.
- සංස්ථාව විසින් වැටුපෙන් 15% ක මුදලක් සේවක අර්ථසාධක අරමුදලට (EPF) වෙත ගෙවන ලබන අතර, සේවකයා විසින් 10% ක මුදලක් සේ. අ. අ. (EPF) වෙත දායකත්වය සපයනු ලැබේ.
- සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) සංස්ථාව විසින් වැටුපෙන් 3% දායකත්වයක් පිරිනමනු ඇත.
- 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුකූලව සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු (MSD) චක්‍රලේඛ අංක 2/2016 සහ 2016.04.25 දතම දරන චක්‍රලේඛය ප්‍රකාරව පාරිතෝෂික දීමනාව හිමිවේ.
- වෙනත් ආන්තික ප්‍රතිලාභ ද අයත් වේ.

**2. ව්‍යාපෘති ලේකම් තනතුර**

(වසර 03 ක් සඳහා කොන්ත්‍රාත්තු පදනම මත)

හොරණ. මිල්ලෑව ඉදිකිරීමට යෝජිත නව නිෂ්පාදනාගාරය සඳහා SPMC (රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ) ඉදිකිරීම් ව්‍යාපෘතියට අදාළ සියලු කරුණු කාරණා සඳහා ව්‍යාපෘති කාර්ය කණ්ඩායමට වගකිව යුතු වන අතර, එම ව්‍යාපෘති ලේකම් තනතුර සඳහා කණ්ඩායමක් වශයෙන් මෙන්ම, ස්වාධීනව වැඩකටයුතු කිරීමට හැකියාව ඇති බහුවිධ කර්තව්‍යය දක්ෂතා ඇති ක්‍රියාශීලි ගතිපැවතුම් ඇති අයෙකු බඳවා ගැනීමට අපේක්ෂා කෙරේ.

**ව්‍යාපෘති ලේකම්ගේ ප්‍රධාන රාජකාරී :**

- සියලුම ලිපිලේඛන ආරක්ෂිතව පවත්වාගෙන යාම.
- ලිපි ලියවිලි, ලේඛන සකස් කර පිළියෙල කිරීම හා වෙනත් අදාළ ලිපි හුවමාරු කටයුතු සිදු කිරීම.
- ව්‍යාපෘති කළමනාකරණ කමිටුව හා මෙහෙයුම් කමිටුව මගින් දෙනු ලබන හා නියම කරනු ලබන කාර්ය කර්තව්‍යයන් ඉටුකිරීමෙහිලා ව්‍යාපෘති සම්බන්ධීකාරක වෙත සහාය වීම.
- SPMC ආයතනයේ අවශ්‍යතාවයන්ට අනුකූලව අතිරේක හා අමතර කාර්ය කර්තව්‍යයන්ද පවරනු ලැබේ.

**සුදුසුකම් :**

1. අපොස (උසස් පෙළ) විභාගය සමත්ව සිටීම හෝ ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමාධාරියෙකු වීම සමග ලේකම් කටයුතු පිළිබඳ සහතිකලාභියෙකු වීම.
2. ඉංග්‍රීසි භාෂාව හැසිරවීමේ චතුරත්වය මනා ලිඛිත හා කථන සන්නිවේදන කුසලතා හිමිවීම විශේෂයෙන් (කාර්යාලයීයව හා ක්ෂේත්‍රයන්හිදී) රැස්වීම් වාර්තා සටහන් පිළියෙල කිරීම.
3. අන්තර් පුද්ගල කුසලතා සහ දක්ෂතා සහිත වෘත්තීයවේදීමය හා ආකර්ෂණීය පෞරුෂත්වයක්හිමි, අයෙකු වීම.
4. ව්‍යාපෘති ලේකම්ධූරයක කාර්ය භාරයක අවම වශයෙන් වසර දෙකක (02) ක පළපුරුද්ද.
5. MS office යෙදවුම් පිළිබඳ ප්‍රවීනයෙකු වීම. (Excel, word and power point)

**වැටුප :** මසකට රුපියල් 60,000/=

**බඳවා ගැනීමේ ක්‍රමවේදය :**

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්.

**ව්‍යාපෘති ලේකම් තනතුර සඳහා වන ආන්තික ප්‍රතිලාභ :**

- සංස්ථාව විසින් සේවක අර්ථසාධක අරමුදලට (EPF) අරමුදලට වැටුපෙන් 15% ක් වශයෙන් ද සේවකයා / (සේවාලාභියා) විසින් 10% ක් වශයෙන්ද දායකවනු ඇත.
- සංස්ථාව විසින් සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදලට (ETF) වැටුපෙන් 3% වශයෙන් දායකත්වය පිරිනමනු ඇත.
- වෙනත් ආන්තික ප්‍රතිලාභද හිමිවේ.

**පොදු උපදෙස් :**

- අයදුම්කරුවන් විසින් නියමිත ආකෘති පත්‍ර භාවත කරමින් ස්වකීය අයදුම්පත් ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම්, ලිපින සහ විමසුම් විස්තරද ඇතුළත්ව, සියලු අදාළ අධ්‍යාපන සහතිකවල සහතික කරන ලද පිටපත්ද සමගින් අයදුම්පත් පහත ලිපිනයට ලැබෙන සේ යොමු කළ යුතුය. අයදුම්පත් ආකෘතිපත්‍ර රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාවේ නිල වෙබ් අඩවිය වන http://www.spmclanka.lk වෙබ් අඩවිය තුළින් බාගත කර ගත හැකිය.
- රජයේ දෙපාර්තමේන්තු රාජ්‍ය සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවල දැනටමත් සේවයේ නියුතු අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් තමන්, මේ තනතුරට තෝරා පත්කරනු ලැබුවහොත් එම තනතුර භාරගැනීම සඳහා අයදුම්කරු / කාරිය නිදහස් කළ හැකිද යන වග සහතික කර තහවුරු කළ හැකි සිය අදාළ ආයතන ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්කරනු ලබන තනතුර අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව ලියා සටහන් කළ යුතු වන අතර, එම අයදුම්පත් පහත ලිපිනයට මෙම දැන්වීමේ දින සිට දින 07 ක් (හතක්) ඇතුළත ලැබෙන සේ ලේඛනගත කළ (ලියාපදිංචි කළ) තැපෑලෙන් එවිය යුතුය.
- ඉහත දක්වන ලද අවශ්‍යතාවයන්ට අනුගත නොවන සියලු අයදුම්පත් භාරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**සභාපති,**
**රාජ්‍ය ඖෂධ නිෂ්පාදන (නීතිගත) සංස්ථාව,**
**අංක 11, ශ්‍රීමත් ජෝන් කොතලාවල මාවත,**
**කඳවලවත්ත, රත්මලාන.**